සැ. යු.-- මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2007 වර්ෂයේ අප්‍රේල් - ජුනි කාර්තුවට අදාලව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,665 - 2010 ජූලි මස 30 වැනි සිකුරාදා - 2010.07.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1264 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1270 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 අගෝස්තු මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජූලි මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකියඃ-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම.
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

### විශේෂ කාර්ය බලකායේ පොලිස් කොස්තාපල් රියැදුරු තනතුර

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්ය බලකායේ ආධුනික පොලිස් කොස්තාපල් රියැදුරු තනතුරු සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලබයි.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයැදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, පළමු මහල, අංක 375, හැව්ලොක් පාර, කොළඹ 06 යන ලිපිනයට එවිය යුතුය. අයැදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ උඩින් ඔබ අයැදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2010.09.24 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයැදුම්පත් ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයැදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයැදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය*.- රු. 1,71,360 - 7 x 1,740 - 10 x 2,160 - 17 x 2,880 - රු. 2,54,100

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ලැබේ :-

(අ) *විශේෂ දුෂ්කර දීමනා*.-

(1) මෙහෙයුම් කලාපවල සේවය සඳහා රු. 1,200
(2) මෙහෙයුම් නොවන කලාපවල සේවය සඳහා රු. 600

(ආ) *සංයුක්ත දීමනා*.-

(1) මෙහෙයුම් කලාපවල සේවය සඳහා රු. 10,500
(2) මෙහෙයුම් නොවන කලාපවල සේවය සඳහා රු. 5,600

(ඇ) නොමිලේ ගමන් පහසුකම්

(ඈ) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටකදී වුව ද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)

(ඉ) සියලුම නිළ ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(ඊ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(උ) රාජකාරි සඳහා ගමන් වියදම්, දුෂ්කර සේවය හා විශිෂ්ඨ රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

(ඌ) විශේෂ කාර්ය බලකායේ මූලික පුහුණුවෙන් පසු විශේෂ කාර්ය බලකායේ සේවය කරන කාලය තුළ පමණක් විශේෂ කාර්ය බලකායේ අනෙකුත් නිලධාරීන්ට ගෙවනු ලබන විශේෂ දීමනා වලට හිමිකම් ඇත.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්*.-

(අ) *වයස් සීමාව - ගැසට් නිවේදනය* අනුව අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 19ත් - 26 ත් අතර විය යුතුය. එසේ වුව ද දැනට පොලිස් දෙපාර්තමේන්තුවේ රාජකාරියේ නියුතු ආරක්ෂක සහායක නිලධාරීන්ට අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයැදුම්කල හැක.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* - අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සමත් විය යුතුයි. වාර දෙකකදී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වර්ෂයේ දී එකවර විෂයයන් 05 කින් සමත් විය යුතුය.

*සටහන 01* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41,44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයයක් ලෙස ද අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් වශයෙන් ද සලකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02* අ. පො. ස. (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03* වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයයන් අ.පො.ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුලත් නොවන හෙයින්, එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

පහත සඳහන් සුදුසුකම් සපුරාලනු ලබන පොලිස් කොස්තාපල් රියැදුරු අයැදුම්කරුවන් සම්බන්ධයෙන් වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

* රජය හෝ රජය පිළිගත් ආයතනයකින් පූර්ණ කාලීනව වසර 03ක මෝටර් කාර්මික පාඨමාලාව හදාරා තිබීම හා එම ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්ද.

(ඇ) *ශාරීරික සුදුසුකම්*.-

* උස අඩි 05 අඟල් 03 (අවම)
* පපුව අඟල් 30යි. (අවම/හුස්ම නාල්ලා)

*සටහන* : විශිෂ්ඨ ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්ත වූ ත්, ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවලදී විශිෂ්ඨත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගී වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයැදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද, අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) *වෘත්තීය සුදුසුකම්*.-

(1) සැහැල්ලු මෝටර් රථ හෝ බර වාහන පැදවීමේ ප්‍රවීණතා සහතිකය ලබා තිබීම.

(2) ඉහත බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් අවුරුදු 01ක මෝටර් රථ පැදවීමේ පළපුරුද්දක් තිබිය යුතුය.

*සටහන* : මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ දැනීම, මෝටර් රථ අලුත්වැඩියාව පිළිබඳ පළපුරුද්ද, රිය පැදවීම දිගු කාලීන පළපුරුද්ද සඳහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

* රිය පැදවීමේ දක්‍ෂතාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන ශාරීරික අවයවයන් හැසිරවීමට බාධා ඇති කරන යම්කිසි අංගවිකලත්වයකින් හෝ වෙනත් ශාරීරික ආබාධයකින් පෙළෙන කිසියම් අපේක්‍ෂකයෙකු වෙතොත් එම අපේක්‍ෂකයා සේවයට සුදුසු බවට වෛද්‍ය සහතිකයක් ලබා තිබුණත්, ඔහු නුසුදුස්සෙකු වනු ඇත.

* මූලික සුදුසුකම් තිබෙන අයදුම්කරුවන් වාහන පැවදීම හා නඩත්තු කිරීමේ හැකියාව පිළිබඳ පරීක්‍ෂා කරනු ලැබේ. එමෙන්ම මාර්ග නීති, රථ වාහන සංඥා ක්‍රම පිළිබඳ අපේක්‍ෂකයන් ලබා ඇති දැනුමත්, එක් එක් අපේක්‍ෂකයා පැදවීමට නිපුනත්වය ලබා ඇති වාහනයෙහි යාන්ත්‍රික සිද්ධාන්තයන් පිළිබඳ මූලික දැනුමක් පරීක්‍ෂා කරනු ලැබේ.

(ඉ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්* - එක් ඇසක දෘෂ්ටිය 6/12 අඩු නොවිය යුතුය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එයද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතුය. යම් අපේක්ෂකයකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඊ) *අනෙක් සුදුසුකම්.-*

* අයදුම්කරුවන් අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන් ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන පොලිස් ආරක්‍ෂක සහායක නිලධාරීන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. බඳවා ගැනීමේ ක්‍රමය -

* අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්‍ෂා කිරීමේ පරීක්‍ෂණයෙන් සමත් විය යුතුය. මූලික සුදුසුකම් පරීක්‍ෂා කිරීමේ පරීක්‍ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්‍ෂණය හෙවත් ඔරොත්තුදීමේ පරීක්‍ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්‍ෂණයෙන් සමත් විය යුතුය.

(1) මීටර් 1000 - මිනිත්තු 03 තත්පර 44

* යෝග්‍යතා පරීක්‍ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්‍ෂණය සඳහා කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්‍ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් වෘත්තීය පරීක්‍ෂණයට කැඳවනු ලැබේ.

06. වෘත්තීයමය පරීක්‍ෂණය-

6.1 වෘත්තීයමය පරීක්‍ෂණය පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්‍ෂකගේ අධීක්‍ෂණය යටතේ පොලිස් රියදුරු පාසැලේ සහකාර අධ්‍යක්‍ෂ විසිනි.

6.2 වෘත්තීයමය පරීක්‍ෂණය සඳහා ලකුණු 100ක් වෙන්කර ඇත. මෙම වෘත්තීයමය පරීක්‍ෂණය පහත පරිදි සමන්විත වේ.

| | | |
|---|---|---|
| (අ) | රිය පැදවීමේ ප්‍රවීනතාවය | ලකුණු 50 |
| (ආ) | මාර්ග නීති උපදේශක සංග්‍රහය | ලකුණු 25 |
| (ඇ) | වාහන නඩත්තු කිරීම සහ සුළු අලුත්වැඩියාවන් පිළිබඳ දැනීම | ලකුණු 25 |

6.3. වෘත්තීයමය පරීක්‍ෂණය රිය පැදවීමේ ප්‍රවීනත්වය සඳහා වෙන්කර ඇති උපරිම ලකුණු 50න් අවම වශයෙන් ලකුණු 25ක් හා මාර්ග නීති උපදේශන සංග්‍රහය සඳහා වෙන්කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5ක් සහ වාහන නඩත්තු කිරීම හා සුලු අලුත්වැඩියාවන් සම්බන්ධ දැනුම සඳහා වෙන්කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5 ක් ද ලබාගෙන වෘත්තිමය පරීක්‍ෂණය සඳහා වෙන් කර ඇති මුලු ලකුණු 100න් ලකුණු 50ක් අවම වශයෙන් ලබාගෙන ඇති අයදුම්කරුවන් වෘත්තීයමය පරීක්‍ෂණය සමත් වූ ලෙස සලකනු ලැබේ. වෘත්තීයමය පරීක්‍ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබේ.

සටහන : බඳවා ගනු ලබන පොලිස් කොස්තාපල් රියදුරන් පරිවාස කාලය අවසන් වීමට ප්‍රථම බර වාහන පැදවීමේ ප්‍රවීනතා සහතිකය ලබාගෙන පොලිස් විද්‍යාලය මඟින් පවත්වනු ලබන බර වාහන පැදවීමේ පරීක්‍ෂණයෙන් සමත් විය යුතුය.

07. වෛද්‍ය පරීක්‍ෂණය -

* ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලබන අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්‍ෂණයකින් සමත් විය යුතුය. වෛද්‍ය පරීක්‍ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. පසුබිම් පරීක්‍ෂණය -

(අ) අයදුම්කරුවන්ගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේද, ඔහු ඇසුරු කරන්නන්ගේ යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්‍ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේදී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

09. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.-* රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 07/2007 අනුව 2007.07.01 දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීනතාවක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබා ගත යුතුය.

2007.07.01 දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරික්ෂණයෙන් සමත් විය යුතුය.

පත්වීමේ දින සිට වසර 05ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීනතාව ලබා නොගන්නා නිළධාරීන්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

10. *පත්වීමේ කොන්දේසි.-* මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

11. *සේවා කොන්දේසි.-*

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතුය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවෙනි සහ දෙවෙනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාටද යටත් විය යුතුය.

(ඈ) (i) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙකු නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ii) තනතුර ස්ථිර කිරීමට පෙර ඉහත ඡේද (ඈ) 1ට අමතරව බර වාහන පැදවීම සම්බන්ධයෙන් පොලිස් විද්‍යාලය මගින් පවත්වනු ලබන පරීක්‍ෂණයෙන් සමත් විය යුතුය.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරීන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් ගැසට් II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 දින පොලිස්පති චක්‍ර ලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 දින එම චක්‍ර ලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03ක පරිවාස සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කලයුතු වන අතර මෙම පරිවාස සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම් ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙලුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04ට අනුකූල විය යුතුය.

(උ) ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන් පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍ර ලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතුය.

(ඌ) ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන් පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍ර ලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතුය.

(එ) ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන් පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පරිපාටි වලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

12. (අ) මෙම ගැසට් පත්‍රයේ 1 වැනි කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

13. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතුය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.)

(අ) උප්පැන්න සහතිකය,
(ආ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක් (ඥාතීන් නොවන),
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,
(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික (තිබේ නම් පමණක්),
(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

14. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කළ යුතුය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත් අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කරනු ලැබූ අදාළ සහතික පිටපත් සමඟ ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියෙකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතුය.

15. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන*.- පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

ආචාර්ය මහින්ද බාලසූරිය,
පොලිස්පති.

**පොලිස් දෙපාර්තමේන්තුව**

***විශේෂ කාර්යය බලකායේ පොලිස් කොස්තාපල් රියදුරු තනතුර***

ආදර්ශ අයැදුම්පත්‍රය

01. (අ) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදි ම විය යුතුය. :————.
(ආ) නම (මුලකුරු සමඟ) :————.
(ඇ) අයැදුම් කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයැදුම්කරු උපන් ස්ථානය :————.
උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය :————.
පළාත :————.

05. (අ) වර්තමාන ලිපිනය :————.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඇ) ස්ථිර ලිපිනය :————.

(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය හා මැතිවරණ කොට්ඨාසය :————.

(ඉ) දුරකථන අංකය (තිබේ නම් පමණක්) :————.

06. (අ) ජාතිය :————.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :

* අයදුම්කරු :————.
* අයදුම්කරුගේ පියා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :————.

07. උපන් දිනය (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි.) :————.

වයස.- (ගැසට් නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කරන දිනට)

අවුරුදු :————, මාස :————, දින :————.

08. උස අඩි :————, අඟල් :————. පපුව :————, අඟල් :————.

09. (1) අධ්‍යාපන සුදුසුකම් (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.) :————.

10. අතිරේක සුදුසුකම් :————. (සහතිකපතේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය)

11. විවාහක/අවිවාහක බව :————.

12. (අ) දැනට කරන රැකියාව :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද? :————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේ ද? :————.

14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :

(අ) ————.

(ආ) ————.

15. (අ) ඔබ පොලිස් උප සේවයේ හෝ නිත්‍ය පොලිස් සේවාවේ තනතුරක් සඳහා මීට පෙර ඉල්ලුම්කර තිබේ ද? :————. (එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න)

(ආ) ඔබ මීට පෙර පොලිස් සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සේවය කර තිබේ ද? එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :————.

16. ඔබ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සාමාජිකයෙක්ද? එසේ නම් පත්වීමේ දිනය නිලය, නිල අංකය සඳහන් කරන්න පත්වීමේ ලිපියේ පිටපතක් අමුණන්න :————.

18. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද ? එසේ නම් අයදුම්පත අදාල හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කල යුතුය. :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත්ද? එසේ නම් අස්වීමේදී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :————.

19. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටියේ ද? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :————.

20. ඔබ යම් කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :————.

21. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද? :————.

එසේම කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ?

එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවටමින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත්වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

07-821

---

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුර

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

02. වැටුප් ක්‍රමය (මාසික) රු. 33,335 - 3 x 790 - 17 x 1050 - රු. 53,555

03. වයස : අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30ට නොඅඩුවීම හා වයස අවුරුදු 40ට නොවැඩිවීම (රජයේ/සංස්ථා සේවයේ නියුක්ත නිලධරයන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

04. සුදුසුකම්

(අ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටින ශ්‍රී ලංකා ජනරජයේ අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයෙකු වීම.

හෝ

(ආ) වර්ෂ හතරකට (04) නොඅඩු කාලයක් ක්‍රියාකාරී ලෙස වෘත්තියෙහි යෙදී සිටි නීතිඥවරයෙකු වීම.

සටහන - යම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක නීතිඥවරයෙකු වශයෙන් මාණ්ඩලික තනතුරක හෝ නීති විද්‍යාලයක නීතිය පිළිබඳ ගුරුවරයෙකු වශයෙන් හෝ සේවය කළ කාල පරිච්ඡේදය ක්‍රියාකාරී වෘත්තියෙහි යෙදී සිටි කාලයක් ලෙස සලකනු ලැබේ.

05. සෑම අයැදුම්කරුවෙක්ම—

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය;
(ආ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

06. පහත සඳහන් ලිපි ලේඛන ඉල්ලා සිටි විට ඉදිරිපත් කිරීමට අයැදුම්කරුවන්ට හැකි විය යුතුය.:-

(අ) උප්පැන්න සහතිකය,
(ආ) උසස්ම අධ්‍යාපන සහතිකය,
(ඇ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය,
(ඈ) සිංහලෙන්, දෙමළෙන්, ඉංග්‍රීසියෙන් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

07. මෙම තනතුර සඳහා අයැදුම්කරන්නන් මෙහි සඳහන් ආදර්ශ ආකෘතිය අනුවම අයැදුම්පත පිළියෙල කළ යුතු අතර එය 2010.09.10 වැනි දින හෝ එදිනට පෙර "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව, කොළඹ 12" යන ලිපිනයට ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

08. රජයේ/රාජ්‍ය සංස්ථා සේවයේ නියුක්තව සිටින නිලධරයන්ගේ අයැදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

09. අයැදුම්පත් ලැබුණු බව දන්වනු ලබන අතර අයැදුම්පත් එවීමෙන් සතියක් ඇතුළත එය ලැබුණු බවට දැන්වීමක් නොලැබුණහොත් අයැදුම්කරු විසින් ලේඛනගත තැපැල් කුවිතාන්සිය ඉදිරිපත් කර මෙම කාර්යාලයෙන් ඒ සම්බන්ධව විමසිය යුතුය.

එම්. පී. ද සිල්වා,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයැදුම්පත්‍රය

01. 1. මුලකුරු සමඟ නම :—————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.

02. 1. ස්ථිර ලිපිනය :—————.
2. කාර්යාලයීය ලිපිනය :—————.

03. ජනවර්ගය :—————.

04. 1. උපන් දිනය :—————.
2. අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවු. :———. මාස :———.දින :———.

05. 1. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
2. විවාහක/අවිවාහක/වැන්දඹු :—————.
3. දරුවන් ගණන :—————.

06. ඉදිරිපත් කරන අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :—————.

07. සමත් වී ඇති උසස් ම විභාගය
1. සිංහලෙන් :—————.
2. දෙමළෙන් :—————.
3. ඉංග්‍රීසියෙන් :—————.

08. ශ්‍රී ලංකා ජනරජයේ අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයෙකු නම් :
1. එම තනතුරට පත්වූ දිනය :—————.
2. සේවය ස්ථිර කළ දිනය :—————.
3. එම තනතුරට පත්වීමට පෙර දැරූ තනතුර :—————.
4. රජයේ/සංස්ථා සේවයේ නම් මුලින්ම පත් වූ තනතුර හා දිනය :—————.
5. වර්තමාන වාර්ෂික වැටුප :—————.

(09 සිට 17 දක්වා ඇති කරුණු නීතිඥවරයෙකු වශයෙන් ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන අයැදුම්කරුවකු විසින් පමණක් සම්පූර්ණ කළ යුතුය.)

09. 1. නීතිඥ වෘත්තියට බඳවා ගන්නා ලද දිනය :—————.
2. ක්‍රියාකාරීව වෘත්තියෙහි යෙදී සිටි කාල පරිච්ඡේදය දින සඳහන් කරමින් :—————.
3. පසුගිය අවුරුද්ද තුළ වෘත්තියෙන් ලැබූ සාමාන්‍ය ආදායම :——————.
4. ඔබ නිතර පෙනී සිටින අධිකරණ :—————.
5. ඔබ නිතර පෙනී සිටින විනිශ්චයකාරවරුන් තිදෙනෙකුගේ නම්
:—————.
:—————.
:—————.

6. ක්‍රියාකාරී වෘත්තියෙහි යෙදී නොමැති නම් නීතිඥවරයෙකු වශයෙන් බඳවා ගැනීමෙන් පසු කරන ලද වෘත්තීන්, දැරූ තනතුරු, දින හා වාර්ෂික වැටුප :—————.

10. පෞද්ගලික ආදායම් ඇතොත් :—————.

1. ලැබෙන මාර්ග :—————.
2. වාර්ෂික ආදායම :—————.

11. පසුගිය අවුරුදු 10 තුළ ඔබ දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද? :—————.

12. මෙම තනතුර සඳහා මීට පෙර ඔබ අයැදුම්කර තිබේද? (එසේ නම් එම වර්ෂය සඳහන් කරන්න.) :—————.

13. ඔබ ආදායම් බදු ගෙවන අයෙක්ද ? :—————.

14. ඔබගේ පෞද්ගලික තොරතුරු විමසිය හැකි දෙදෙනෙකුගේ නම් පහත සඳහන් කරන්න. ඒ අය ඔබ ගැන දන්නා වගකිවයුතු පුද්ගලයන් විය යුතුය.

(i) නම :—————.
(ii) තනතුර :—————.
(iii) ලිපිනය :—————.

(i) නම :—————.
(ii) තනතුර :—————.
(iii) ලිපිනය :—————.

15. ඔබට විරුද්ධව කිසියම් විනය පරීක්ෂණයක් හෝ චෝදනාවක් දැනට තිබේ ද? මීට පෙර තිබුණේ ද? එහි ස්වභාවය සඳහන් කරන්න. :—————.

16. ඔබ රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්වීමකින් හැර අන් අයුරකින් සේවය අතහැර ගිය අයෙක් වේද ? :—————.

17. ඔබගේ කුසලතාවය පිළිබඳ ලබාගත් සහතික ඇතොත් සඳහන් කරන්න.

මෙම අයැදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් මෙහි සඳහන් යම්කිසි තොරතුරක් අසත්‍ය බැව් හෝ වැරදි බැව් හෝ මා තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුස්සෙකු වීමට ද, මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව එම වරද දැනගැනීමට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත්වන බැව් මම දනිමි.

—————.
අයැදුම්කරුගේ අත්සන.

දිනය :—————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

..........................මහතා/මහත්මිය/මෙනෙවිය මෙම අධිකරණයේ/ දෙපාර්තමේන්තුවේ/ අමාත්‍යාංශයේ/ සංස්ථාවේ .................. තනතුරේ සේවය කරන බැව් ද, ඔහු/ඇය විසින් ඉහත සඳහන් කරනු ලැබ ඇති කරුණු නිවැරදි බව ද සහතික කරමි. .................. මහතා/මහත්මිය/මෙනෙවිය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් මුදා හැරිය හැකි බවද දන්වමි.

—————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

තනතුර :—————.
නිල මුද්‍රාව :—————.
දිනය :—————.

07-952

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කෑගල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2010 අගෝස්තු මස 30 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010ක් වූ ජූලි මස 14 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/A3 හි
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කෑගල්ල | රුවන්වැල්ල | කරවනැල්ල මූලික රෝහල් කොට්ඨාසය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල. |

07-1001

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

මගේ අංකය : ඒ බී/2ඒ/74(1).
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
කොළඹ 01.
2010 ජූලි මස 08 වැනි දින.

**ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව**

ඒකාබද්ධ රේගු සේවයේ II වන පන්තියට බඳවා ගැනීම

1996.04.06 දින විභාග කොමසාරිස් විසින් පවත්වන ලද ඉහත සඳහන් විභාගයේ පහත නම් සඳහන් අයදුම්කරුවන් ඒකාබද්ධ රේගු සේවයේ II වන පන්තියට 1997.12.15 වැනි දින සිට බඳවා ගන්නා ලදී :

| අංක | නම | ලිපිනය |
|---|---|---|
| 1 | ඒ. ජී. සී. සෙනෙවිරත්න මිය | අංක 648/9, මුවන්හෙලවත්ත, තලංගම උතුර, බත්තරමුල්ල |
| 2. | ජේ. ආර්. වර්ණකුලගේ මහතා | අංක 06, දාඹුගහවත්ත පාර, තලංගම උතුර, මාලබේ. |
| 3. | ඩී. කේ. ඩී. විජයවීර මහතා | අංක 57/40, ගැමුණුපුර, පන්නිපිටිය |
| 4. | ආර්. සී. විජේසේන මහතා | අංක 284/2, කෑගල්ල පාර, පොල්ගහවෙල |
| 5. | එස්. අතුකෝරාල මහතා | අංක 71/6, නාවල පාර, නුගේගොඩ |
| 6. | සී. පී. ජී. පුංචිහේවා මහතා | අංක 412/13, වානගුරු මාවත, හෝකන්දර උතුර, හෝකන්දර |
| 7. | එස්. ඩී. අබේසේකර මිය | අංක 141/3, පොල්හේන්ගොඩ පාර, කොළඹ 05 |
| 8. | ජේ. එන්. මිරිහාගල්ල මහතා | අංක 47/33, පෙරේරා මාවත, පැලවත්ත, බත්තරමුල්ල |
| 9. | එම්. ඩබ්. ආර්. තිසේරා මහතා | අංක 53/3, කල්එලිය පාර, කපුවත්ත, ජා ඇල |
| 10. | ඒ. ඩබ්. ජී. එස්. එස්. වීරකෝන් මහතා | අංක 87සී, උඩුපිල, දෙල්ගොඩ |
| 11. | පී. වී. එම්. ප්‍රනාන්දු මහතා | අංක 150/11, ශාන්ති මාවත, බත්තරමුල්ල |
| 12. | ඩී. ඒ. ටී. ආර්. වර්ණකුලසූරිය මහතා | අංක 219, නුගේගොඩ පාර, පැපිලියාන, බොරලැස්ගමුව |
| 13. | කේ. යූ. ඩී. සේනාරත්න මහතා | අංක 22ඒ, රූපසිංහ මාවත, නුගේගොඩ |
| 14. | ඩබ්. ආර්. පී. වික්‍රමරත්න මහතා | අංක 500/43සී, රුවන්පුර, අග්ගොන, අංගොඩ |
| 15. | කේ. පී. එස්. ඒ. පී. වැලිගේපොල මහතා | අංක 875, "සන්ධ්‍යා නිවස", වරාගොඩ පාර, සිංහාරමුල්ල, කැළණිය |
| 16. | ඩබ්. කේ. ඒ. පී. සී. අබේසිංහ මහතා | අංක 76/3ඒ, එදිරිසිංහ පාර, මිරිහාන, නුගේගොඩ |
| 17. | බී. වන්නිආරච්චි මහතා | අංක 41/1, ඩී. සොයිසා පාර, පානදුර |
| 18. | ජේ. එස්. ජයසේකර මහතා | අංක 6, ශ්‍රී බෝධි පාර, ගම්පහ |
| 19. | එල්. අයි. එන්. පෙරේරා මහතා | තානායම් වත්ත, බණ්ඩාරගම |
| 20. | කේ. බී. එල්. ද සිල්වා මහතා | අංක 132/1/එෆ්, ඇරැව්වල, පන්නිපිටිය |
| 21. | පී. විජේනායක මිය | අංක 240/16, මහවත්ත පාර, තලංගම උතුර, බත්තරමුල්ල |
| 22. | ජේ. ඒ. කේ. කේ. ප්‍රදීප් මහතා | අංක 344/5, එකමුතු මාවත, තලංගම උතුර, බත්තරමුල්ල |
| 23. | ඩබ්. ඒ. එස්. කුමාර මහතා | අංක 152ඊ, කළුවල පාර, ගනේමුල්ල |
| 24. | බී. ඒ. එච්. කරුණාරත්න මිය | අංක 376/9, සුසිරි උයන, හිඹුටාන පාර, අංගොඩ |
| 25. | ඩබ්. පී. ඒ. එෆ්. ගුණසේකර මහතා | මීගමුව පාර, නාගොඩ, කඳාන |
| 26. | එච්. එච්. ජේ. වික්‍රමසිංහ මිය | අංක 51, අබේගුණරත්න මාවත, පඹුරන, මාතර |
| 27. | ඒ. ඩී. එන්. ආරියපාල මහතා | අංක 15/110, සෙලින්කෝ නිවාස, පලමු පටුමග, නුවර පාර, කැළණිය |
| 28. | එස්. එම්. එම්. කේ. සිරිවර්ධන මහතා | අංක 20, ගල්වල වත්ත, පේරාදෙනිය |
| 29. | ජී. එම්. ටී. එන්. විජේසේන මහතා | අංක 254/1ඒ, නිදහස් මාවත, බත්තරමුල්ල |
| 30. | ඩබ්. ඩී. එම්. ප්‍රනාන්දු මහතා | අංක 6/2, ඉදුරුගල්ල, වතුරේගම |
| 31. | ඒ. එස්. එන්. පතිනිසේකර මහතා | අංක 102/5, වෙරළුගහ වත්ත, කපුවත්ත, ජාඇල |
| 32. | ඒ. ප්‍රියන්ත මහතා | "චම්පා", හාලුගම, මීරිගම |
| 33. | එම්. ඩී. පී. එම්. පෙරේරා මහතා | අංක 264/ඒ/2, 6 වන පටුමග, ශාන්තිපුර, තලවතුගොඩ |
| 34. | යූ. ඩී. එම්. ඕ. දීපානි මිය | අංක 60/2, බාලසූරිය මාවත, හපුගොඩ, කඳාන |
| 35. | ආර්. එස්. වීරසිරි මහතා | අංක 77, වලාන පාර, වලාන, පානදුර |
| 36. | එස්. පී. ඩබ්. පතිරන මහතා | අංක 391, අඳුරත්විල, පෝද්දල |
| 37. | එච්. ඒ. එස්. විමලකීර්ති මහතා | වික්ලන්ඩ් වත්ත, උළුවිටිකේ, ගාල්ල |
| 38. | එච්. ඩී. ජී. සුමතිපාල මහතා | අංක 485, විජයසිරි නිවස, මාම්පේ උතුර, පිළියන්දල |
| 39. | එස්. ඩී. ඒ. කුමාරසිරි මහතා | අංක 59/එල්/15, "සිසිලස", පද්මපෙරුම මාවත, ගලහිටියාව, ගනේමුල්ල |
| 40. | බී. එස්. පී. මැදගම මහතා | අංක 29, ඥානරත්න මාවත, දෙහිවල පාර, පැපිලියාන |
| 41. | ආර්. ඒ. එල්. කේ. රණසිංහ මහතා | අංක 72ඒ, ටෙම්ප්ලර්ස් පාර, ගල්කිස්ස |
| 42. | එන්. පී. පී. රත්නායක මහතා | අංක 16, අළුබෝගහවත්ත, ඇන්ඩර්සන් පාර, දෙහිවල |
| 43. | පී. අයි. උදය මහතා | අංක 15, පීරිස් පාර, ගල්කිස්ස |
| 44. | ඩබ්. එස්. සී. වික්‍රමසේකර මහතා | අංක 42, බත්තරමුල්ල පාර, ඇතුල්කෝට්ටේ |
| 45. | එස්. ෂන්මුගරාජා මහතා | අංක 43, හුණුපිටිය පාර, වත්තල |
| 46. | ආර්. පී. ඒ. එස්. බාලසූරිය මහතා | අංක 119/6, ඉහල ඉඹුල්ගොඩ, ඉඹුල්ගොඩ |
| 47. | බී. මීරිගම මහතා | අංක 41/3ජී, බ්ලැක් පර්ල් එස්ටේට්, මීගොඩ |
| 48. | එම්. එම්. ඩී. එම්. බී. මුණසිංහ මහතා | සමගි මාවත,මාකඳුර, ගෝනවිල |
| 49. | එස්. බී. පොල්කොටුව මහතා | අංක 6, මහබාගේ හන්දිය, මත්තුමගල, රාගම |

| අංක | නම | ලිපිනය |
|---|---|---|
| 50. | එම්. ඩබ්. එස්. ද සිල්වා මිය | අංක 222/3ඒ, පාඨලිරුක්බාරාම පාර, වෑකඩ, පානදුර |
| 51. | සී. එස්. වික්‍රමරත්න මිය | අංක 120, නිව්සිටි ගාර්ඩන්ස්, ගැඩබුවාන අළුත් පාර, පිළියන්දල |
| 52. | ඩී. ජී. අයි. යූ. ගෝනවල මහතා | අංක 15, සාමදාන මාවත, මාකොළ උතුර, මාකොළ |
| 53. | එස්. ඒ. යූ. ඉන්ද්‍රජිත් මහතා | අංක 89, ගාලු පාර, කුඩා පයාගල, පයාගල |
| 54. | ජී. එස්. බී. මාරසිංහ මහතා | අංක 369/1සී, පිංතාලිය පාර, පහළ බියන්විල, කඩවත |
| 55. | පී. එච්. යූ. අයි. විජේපාල මහතා | අංක 211ඒ, අයි. ආර්. පෙරේරා මාවත, අළුබෝමුල්ල, පානදුර |
| 56. | ආර්. ඒ. ඩී. පී. සී. කුලසිංහ මිය | අංක 13, රෝහණ මාවත, සුභූතිපුර, බත්තරමුල්ල |
| 57. | ඩී. එස්. පී. තිලකරත්න මහතා | අංක 186/2ඒ, බොරැල්ල පාර, දෙපානම, පන්නිපිටිය |
| 58. | ඩබ්. එම්. පී. අමරනායක මහතා | අරලිය මාවත, තිබ්බටුගොඩ, පොකුණුවිට |
| 59. | එල්. එම්. කුමාරපේලි මහතා | අංක 209/1. බියගම පාර, කැළණිය |
| 60. | එම්. ආර්. කේ. ලෙනගල මහතා | කවුඩුමුන්න, දඹදෙනිය. |
| 61. | එස්. එස්. රවිප්‍රිය මහතා | අංක 189/54, ගල්රෝද පාර, පහල කරගහමුණ, කඩවත |
| 62. | කේ. රාජපක්ෂ මහතා | අංක 34ඒ, ගල්වල පාර, මිරිහාන, නුගේගොඩ |
| 63. | එම්. බී. රම්පාල මහතා | අංක 412/13/1, සුමිතුරු උයන, පහල ඉඹුල්ගොඩ, ඉඹුල්ගොඩ |
| 64. | ඒ. ඩබ්. එල්. සී. වීරකෝන් මහතා | අංක 206 එෆ්. පට්ටියවත්ත පාර, කොතලාවල, කඩුවෙල |
| 65. | එම්. කේ. විජේකුලසූරිය මහතා | අංක 10/139, පිටකන්ද පාර, මහනුවර |
| 66. | ඒ. යූ. ජයකොඩි මහතා | අංක 733/21, සිල්වර් වැලි වත්ත, කෝරලේ ඉම, ගෝනපල හන්දිය |
| 67. | එන්. ඩී. ද එස්. ජයසිංහ මහතා | අංක 39/2ඒ, ශාන්ත රීටාගේ මාවත, ගල්කිස්ස |
| 68. | කේ. එල්. පී. කුමාර මහතා | අංක 406, නල්ලවත්ත පාර, මහරගම |
| 69. | කේ. ජේ. ධර්මසේන මහතා | බංගලාවත්ත, දේවාලේගම, කෑගල්ල |
| 70. | එම්. කේ. යූ. ගාමිණි මහතා | අංක 270, පින්තාලිය පාර, පහල බියන්විල, කඩවත |
| 71. | වයි. එම්. එස්. කුමාර මහතා | අංක 53/3/බී/2, 4 වැනි පටුමග, හංසගිරි පාර, ගම්පහ |
| 72. | අයි. එන්. ඒකනායක මහතා | අංක 1325/9ඒ, බෝගහවත්ත පාර, පන්නිපිටිය |
| 73. | ටී. ඒ. ඒ. එම්. කරුණාරත්න මහතා | අංක 927/18ඒ, සේවන පෙදෙස, උඩවත්ත පාර, මාලබේ |
| 74. | එස්. එම්. බී. එම්. එම්. පී. කේ. ප්‍රේමරත්න මහතා | එරික් බතික්, නුවර පාර, කළගෙඩිහේන |
| 75. | කේ. බී. ඕ. වී. විජේසේකර මිය | "විජයසිරි", සමගි මාවත, ඇල්පිටිය |
| 76. | පී. ඩබ්. ඒ. සී. වීරමන් මහතා | අංක 44/ඒ, මාකොළ උතුර, මාකොළ |
| 77. | එස්. මොහොමඩ් අස්රොෆ් මහතා | අංක 28, නිකොල් ඔය පාර, පරණ පොලිසිය මාවත, රත්තොට |
| 78. | සී. එල්. අඹගහවත්ත මහතා | අංක 33/ඊ/32, මිහිඳු මාවත, මාළඹේ. |
| 79. | ඩී. එම්. කේ. ටී. දහනායක මහතා | පහලගම, පොතුහැර |
| 80. | එස්. ඒ. සී. පී. කුමාර මහතා | අංක 32, ද සොයිසා පාර, කොළඹ 02 |
| 81. | පී. කේ. ආරච්චි මහතා | අංක 1037/4, 3 වැනි පටුමග, පැරකුම්බා පෙදෙස, මාළබේ |
| 82. | එන්. එස්. කුමානායක මහතා | ඉසුරු මාවත, හිත්තැටිය, මාතර |
| 83. | කේ. එන්. සූරියආරච්චි මහතා | අංක 369/1ඩී, පින්තාලිය පාර, කඩවත |
| 84. | ඩබ්. එල්. සී. තිලකසිරි මහතා | අංක 31බී, 4 වැනි පටුමග, සාරභූමි, මඩපාත පාර, පිළියන්දල |
| 85. | කේ. එන්. ෂන්මුගදාසන් මහතා | අංක 210/16, ගවනර්ස් පාර්ක්, ඒ. එස්. පී. ලියනගේ මාවත, වත්තල |
| 86. | ඒ. ඒ. ඩී. එන්. අමරසිංහ මහතා | අංක 112, මහබෙල්ලන, අළුබෝමුල්ල. |
| 87. | ජේ. ජේ. අබේසිරිවර්ධන මහතා | අංක 35, "අසෝක", දඹරව, පිල්ලෑව, මහනුවර |
| 88. | ජේ. සී. අබේවර්ධන මහතා | අංක 498, නඩුහේන, මීගොඩ |
| 89. | එස්. ඩී. රාජපක්ෂ මහතා | අංක ඒ 7, මාතා පාර, මැනිං ටවුන්, කොළඹ 08. |
| 90. | එච්. ගුරුගේ මහතා | අංක 31/2/2, ගර්ටන් විද්‍යාල පාර, නුගේගොඩ |
| 91. | එම්. කේ. ප්‍රේමදාස මහතා | අංක 136/3, මහාබෝධි මාවත, 9 වැනි සැතපුම් කණුව, කඩවත |
| 92. | පී. කේ. බී. කේ. ඒ. පල්ලාවල මහතා | අංක 52/සී, පහලගම, ගම්පහ |
| 93. | එල්. ඒ. ඒ. රූපසිරි මහතා | අංක 224ඒ, ජයා මාවත, කඩවත |
| 94. | එච්. එම්. එන්. එස්. රාජගුරු මහතා | අංක 303, කටුගස්තොට පාර, මහනුවර |
| 95. | ඒ. එච්. ආර්. සමන්ත මහතා | අංක 74/7, මාකොළ පාර, කිරිබත්ගොඩ |
| 96. | ඊ. කේ. සී. සෙනරත් මහතා | අංක 500/45, රුවන්පුර, අග්ගොන, අංගොඩ |
| 97. | යූ. එස්. විදානගම මහතා | අංක 45, කරුණාතිලක මාවත, 7 වැනි පටුමග, තලංගම උතුර, බත්තරමුල්ල |
| 98. | කේ. පී. ඩබ්. එච්. කරුණාතිලක මහතා | අංක 21ඩී, සමිට් මහල් නිවාස, කැප්පෙටිපොල පාර, කොළඹ 05 |
| 99. | එස්. සෙල්වකුමාර් මහතා | අංක 18-3/1, 37 වැනි පටුමග, කොළඹ 06 |
| 100. | ඩබ්. ඒ. ඩී. බී. කේ. අබේසේකර මහතා | අංක 95බී, නුවර පාර, දළුගම, කැළණිය |
| 101. | ටී. ඩී. සී. ධර්මප්‍රිය මහතා | අංක 31/1බී, 2 වැනි පටුමග, අඹගහමුල්ල, බොරලැස්ගමුව |
| 102. | ජී. සී. පී. ගමගේ මහතා | අංක 21/5ඒ, පාළුගම, දොම්පේ |
| 103. | එච්. එම්. කේ. පී. හේරත් මහතා | අංක 342/3, පාසැල් මාවත, කළපළුවාව, රාජගිරිය |
| 104. | පී. ඒ. ඩී. පී. පෙරේරා මහතා | අංක 240, රද්දොළුව, සීදූව |
| 105. | වයි. එම්. පී. ප්‍රේමචන්ද්‍ර මහතා | අංක බී/130, ඉඹුල්හේන, පනාකාව, කෑගල්ල |
| 106. | ජී. කේ. එන්. පෙරේරා මහතා | අංක 32/3, තලාහේන, මීගමුව |
| 107. | එම්. ඒ. ඒ. ශාන්ත මහතා | අංක 292ඊ, අන්නාසිවත්ත පාර, ගලහිටියාව, ගනේමුල්ල |
| 108. | ඩබ්. ඒ. සී. ජේ. කේ. විජේසුන්දර මහතා | අංක 33/ඊ/3, මිහිඳුමාවත, මාළඹේ |
| 109. | අයි. ඕ. වී. වීරසිංහ මහතා | අංක 26/12ඒ, පරණ කොට්ටාව පාර, මිරිහාන, නුගේගොඩ |
| 110. | පී. එල්. වනිගසිංහ මහතා | අංක සී 21, මාතා පාර, මැනින් ටවුන්, කොළඹ 08 |
| 111. | යූ. එන්. දුසන්ත මහතා | අංක 214සී, පන්නිපිටිය පාර, තලවතුගොඩ. |
| 112. | ආර්. එන්. සී. වීරසිංහ මහතා | අංක 94, එල්ලක්කාල. |

සුධර්මා කරුණාරත්න,
රේගු අධ්‍යක්ෂ ජනරාල්.

07-868/1

මගේ අංකය : ඒබී/2ඒ/74(1).
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
කොළඹ 01.
2010 ජූලි මස 08 වැනි දින.

## ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

ඒකාබද්ධ රේගු සේවයේ II වන පන්තියට බඳවා ගැනීම

1996.04.06 දින විභාග කොමසාරිස් විසින් පවත්වන ලද ඉහත සඳහන් විභාගයේ පහත නම් සඳහන් අයදුම්කරුවන් ඒකාබද්ධ රේගු සේවයේ II වන පන්තියට 1998.01.15 වැනි දින සිට බඳවා ගන්නා ලදී. :

| *අංකය* | *නම* | *ලිපිනය* |
|---|---|---|
| 1 | ශාන් අබේධීර මහතා | අංක 4/5, කොස්වත්ත, කිරිබත්ගොඩ |
| 2 | ඒ. සී. කරුණාහරන් මහතා | අංක 218/2 1/1, ගාලු පාර, ගල්කිස්ස |
| 3 | එම්. එස්. ඉසෙඩ් ෆායික් මහතා | අංක 33, රෝලි ප්‍රනාන්දු මාවත, කටුබැද්ද, මොරටුව |
| 4. | එස්. ජෙයකාන්තන් මහතා | අංක 119-1/2, ඩබ්. ඒ. සිල්වා මාවත, කොළඹ 06 |
| 5. | එස්. ලුක්මන් මහතා | අංක 56, දොස්තර බ්‍රිටෝ බබාපුල්ලේ පාර, කොළඹ 14 |
| 6. | ඥානමෝහන් මහතා | අංක 81-2/2, මැනිං පෙදෙස, කොළඹ 06 |
| 7. | ඒ. එල්. එම්. සහීර් මහතා | අංක 46/20, ආසිරි මාවත, කළුබෝවිල, දෙහිවල |
| 8. | එම්. අයි. එම්. මුහුරිස් මහතා | අංක 133/1, කවුඩාන පාර, දෙහිවල |
| 9. | එස්. නඩේසන් මිය | අංක 53, ශාන්ත මේරි පාර, කොළඹ 15. |
| 10. | ඒ. සඳගෝබන් මහතා | අංක 65ඒ, හේන පාර, ගල්කිස්ස |

සුධර්මා කරුණාරත්න,
රේගු අධ්‍යක්ෂ ජනරාල්.

07-868/2

---

මගේ අංකය : ඒබී/2ඒ/74(1).
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
කොළඹ 01.
2010 ජූලි මස 08 වැනි දින.

## ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

ඒකාබද්ධ රේගු සේවයේ II වන පන්තියට බඳවා ගැනීම

1996.04.06 දින විභාග කොමසාරිස් විසින් පවත්වන ලද ඉහත සඳහන් විභාගයේ පහත නම් සඳහන් අයදුම්කරුවන් ඒකාබද්ධ රේගු සේවයේ II වන පන්තියට 1998.07.30 වැනි දින සිට බඳවා ගන්නා ලදී. :

| *අංකය* | *නම* | *ලිපිනය* |
|---|---|---|
| 1 | එන්. යූ. කේ. බානගල මිය | අංක 385/1/2, ශාන්ති මාවත, කිරිල්ලවල, කඩවත |

සුධර්මා කරුණාරත්න,
රේගු අධ්‍යක්ෂ ජනරාල්.

07-868/3

---

## සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවේ විද්‍යුත් නිකර්පන රේඛන සටහන්කරු පුහුණුව සඳහා සිසුන් බඳවා ගැනීම - 2010

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවේ විද්‍යුත් නිකර්පන රේඛන සටහන්කරු පුහුණුව සඳහා සිසුන් බඳවා ගැනීම පිණිස සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. 2003 සිට 2007 දක්වා විද්‍යා අංශයෙන් අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ලබා ගන්නා ලද Z අගය අනුව සකස් කළ ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කර ගනිමින් සුදුසුකම් ලැබුවන් පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ.

02. පුහුණු පාඨමාලාවට බඳවාගත හැකි සංඛ්‍යාව අනුව දිස්ත්‍රික් ජනගහන අනුපාතය පදනම්කර ගනිමින් සිසුන් පාඨමාලාවන් සඳහා තෝරා ගනු ලැබේ.

03. (i) මෙම පාඨමාලාව පූර්ණකාලීන පාඨමාලාවක් බැවින්, සතියේ දින පහ සහ සෙනසුරාදා පෙරවරුවේ වෙනත් පාඨමාලාවන් හදාරන සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් නොකළ යුතුයි.

(ii) කිසියම් දිනක ඔබ කුමන හෝ විශ්ව විද්‍යාලයක පාඨමාලාවක් සඳහා ලියාපදිංචිව සිටියේ නම් හෝ සිටින්නේ නම් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දින වනවිට ඔබ විසින් එම ලියාපදිංචිය අවලංගු කරගෙන තිබිය යුතුය. (ඔබ විශ්ව විද්‍යාලයක ලියාපදිංචිව සිට දේශන සඳහා සහභාගී වී නොමැති/නොවන අයෙක් වුවද ඔබ විශ්ව විද්‍යාල සිසුවෙකු සේ සලකනු ලබන බැවින්, එවන් අයදුම්කරුවන්ද තම ලියාපදිංචිය අවලංගු කරගත යුතු ය.)

(iii) ඔබ යම් විශ්ව විද්‍යාලයක උපාධිය සම්පූර්ණ කර සිටින අයෙක් නම් එම උපාධිය බලපැවැත්වෙන දිනය (Effective Date) අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනට පෙර දිනයක් විය යුතුය.

සැලකිය යුතු ය :-

ඉහත 03. II හා/හෝ 03. iii අනුව, ඔබ විසින් විශ්ව විද්‍යාල ලියාපදිංචිය අවලංගු කර ගන්නේ නම් හෝ දැනට උපාධිය සම්පූර්ණ කර සිටී නම් හෝ අනිවාර්යයෙන්ම ඔබ විද්‍යුත් නිකර්පන රේඛන සටහන්කරු පාඨමාලාව සඳහා ඇතුලත් කර ගන්නේ ය යන්න මෙම *ගැසට් නිවේදනයේ* කුමන හෝ වගන්තියක් මඟින් අදහස් නොකෙරෙන බව ඔබ තරයේ සිහි තබාගත යුතුය.

එසේ ලියාපදිංචිය අවලංගු කරගෙන හෝ උපාධිය සම්පූර්ණ කර හෝ තිබෙන නමුත් ප්‍රමාණවත් Z අගයක් ඔබ විසින් ලබාගෙන නොමැති නම් කිසිඳු අයුරකින් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන බව ඔබ විසින් දැනගත යුතුය.

එමෙන්ම, ඔබ විසින් ප්‍රමාණවත් Z අගයක් ලබාගෙන ඇති නමුත් ඉහත 03. i, 03. ii සහ 03. iii යන වගන්තිවල සඳහන් කරුණු ඔබ විසින් සම්පූර්ණ කිරීමට අසමත් වන්නේ නම් කිසිඳු අයුරකින් මෙම පාඨමාලාව සඳහා ඔබ සුදුසුකම් නොලබන බවද ඔබ විසින් තවදුරටත් දැනගත යුතු ය.

04. පුහුණු කාලය වසර එකකි.

05. *අධ්‍යාපන සුදුසුකම් :*

5.1 අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක්

සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයන් හයකින් සමත් විය යුතුය.

5.2 2003 සිට 2007 දක්වා අ. පො. ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි භෞතික විද්‍යාව විෂයය සමත්ව තිබීම සහ ජීව විද්‍යාව/සත්ත්ව විද්‍යාව විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විද්‍යා විෂයය ධාරාවෙන් (උද්භිද විද්‍යාව, කෘෂි විද්‍යාව සහ රසායන විද්‍යාව) එක් විෂයයක් ද ඇතුළුව විෂයන් තුනකින් එකවර සමත්වී තිබීම.

අයදුම්පතෙහි අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ Z අගය ඇතුළත් කිරීම අනිවාර්ය වේ.

06. *අනෙකුත් සුදුසුකම් :*

(අ) 2010.08.31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු, වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය.
(ආ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුයි.
(ඇ) මනා ශාරීරික සෞඛ්‍යකින් යුක්ත විය යුතුයි.
(ඈ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අවුරුදු තුනක් පදිංචිව සිටිය යුතුය.

07. *අයදුම් කළ යුතු ක්‍රමය :*

(අ) මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පතක් සකස් කර ගතයුතුවේ. අයදුම්පතේ "මුද්දර" යන ස්ථානයේ රුපියල් 500 ක මුද්දරයක් අලවා තම අත්සන යොදා එය අවලංගු කළ යුතුවේ.

(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන පරිපාලන සේවයේ/ රජයේ ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 2,40,360කට නොඅඩු වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විසින් අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතුවේ.

(ඇ) අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර එය බහාලන කවරයේ වම් කෙළවරේ "විද්‍යුත් නිකර්පන රේඛන සටහන්කරු තනතුරු සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කොට 2010 අගෝස්තු මස 31 වැනි දින හෝ ඊට පෙර "අධ්‍යක්ෂ(පාලන) 02, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

08. අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ.

09. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

10. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. ඉහත අධ්‍යාපන සුදුසුකම් සහ අනෙකුත් සුදුසුකම් සපුරා ඇති නිසි පරිදි අයදුම්පත් එවූ අපේක්ෂයන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය සහතික මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(අ) උප්පැන්න සහතිකය;

(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකය හෝ මුල් සහතික නිකුත් කර නැති විට බාහිර අයදුම්කරුවන්ට නිකුත් කළ ප්‍රතිඵල ලේඛනය හෝ අයදුම්කරු විභාගයට පෙනී සිටි විදුහලේ විදුහල්පතිවරයා නිකුත් කළ මුල් ලිපිය යනාදී ලිපි ලේඛන.

(ඇ) විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අ. පො. ස. (උ. පෙළ) Z ලකුණු සහතිකය.

(ඈ) ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය.

(ඉ) දිස්ත්‍රික්කය තුළ වසර 03ක ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් අනු අත්සන යෙදූ ග්‍රාම සේවා සහතිකය.

12. *පුහුණු කිරීමේ පරිපාටිය :*

(අ) තෝරාගත් අයදුම්කරුවන් ඉහත පුහුණුව සඳහා අදාල පුහුණු පාසැලට ඇතුළත් කරනු ලැබේ. පාඨමාලාවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය යුතුවේ.

(ආ) පුහුණුව සඳහා ඇතුළත් කරන සිසුන් පුහුණු පාසල්වල බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත..

(ඇ) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාග වලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ පුහුණු පාසලෙහි කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කරනු ඇත.

(ඈ) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ සිසුන්ට රුපියල් 6,000 ක මාසිකව දීමනාවක් ගෙවනු ලැබේ.

(ඉ) පුහුණු පාසලට ඇතුළත් වන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව පත්වීම් ලැබුවහොත් අවම වශයෙන් අවුරුදු 10ක කාලපරිච්ඡේදයක් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට එළඹිය යුතුය. පුහුණුව ලබන කාලය තුළ පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැරගියහොත් ඉහත (ඇ) ඡේදය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් පුහුණු කාලය තුළ ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව හා රජය විසින් දරන ලද වියහියදම් සඳහා වැයවූ මුදල, ඔහු/ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වේ. එසේ නොවුවහොත් ගිවිසුම් ප්‍රකාරව එම මුදල් අයකර ගැනීමට නිසි පියවර ගනු ඇත.

13. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :

පුහුණුව අවසානයේ දී රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට ද රජය බැඳී නොසිටී. එහෙත්, බඳවා ගනු ලබන පළාතේ පුරප්පාඩු තිබේ නම් පමණක් අවසන් පරීක්ෂණයෙන් සමත් වන අපේක්ෂකයන්ට දෙපාර්තමේන්තුව මගින් ඔවුන් ලබා ඇති කුසලතාවය පදනම් කර ගනිමින් අදාළ තනතුරේ III පංතියේ තනතුරු සඳහා පත් කරනු ලැබේ. මුල් පත්වීමේ සිට වසර දෙකක් මුල් පත්වීමේ ස්ථානයේ රැඳී සිටීම අනිවාර්ය වේ.

14. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර ඉල්ලුම්පත්‍ර පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම ලැබීමෙන් පසු යටකී සහතික

ව්‍යාජ බවට ඔප්පු වුවහොත් ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/සේවයෙන් පහකරන අතර, නැවත රජයේ සේවයට නොගන්නාවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

15. තෝරාගත් අයදුම්කරු/අයදුම්කාරිය අදාළ පාඨමාලාවන් හැදෑරීමට සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික සහ මානසික වශයෙන් යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු වස් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අපේක්ෂකයින් පුහුණු පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

16. ඉහත පරිදි බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් රජයේ සේවකයන් ලෙස අදාළ වන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් හා වෙනත් රෙගුලාසිවලට ද, රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත්වනු ඇත.

17. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය නොවන යම් ගැටළු සහගත කරුණක් උද්ගත වුවහොත් ඒ පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

වෛද්‍ය, රවින්ද්‍ර රුබේරු,
ලේකම්,
සෞඛ්‍ය, අමාත්‍යාංශය.

2010 ජූලි මස 07 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය,"
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

## අයදුම්පත්‍රය

### සෞඛ්‍ය අමාත්‍යාංශය

***අතුරු වෛද්‍ය සේවාවේ විද්‍යුත් නිකර්පන රේඛන සටහන්කරු පුහුණුව සඳහා සිසුන් බඳවා ගැනීම - 2010***

01. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ආ) සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

02. තැපැල් ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

03. (i) ස්ථිර ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ii) දිස්ත්‍රික්කය :

(iii) ඔබ මෙම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවෙක් ද ?
ඔව්/නැත

(iv) ඔව් නම් කොපමණ කලක පටන් ද?

04. උපන් දිනය : වර්ෂය :———, මාසය :——, දිනය :——.

2010.08.31 දිනට වයස : අවුරුදු :———, මාස :——, දින :——.

05. ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ කොටුවේ '✓' යොදන්න)

| | |
|---|---|
| ස්ත්‍රී | |
| පුරුෂ | |

06. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද ? යනවග (අදාල කොටුවේ '✓' යොදන්න) :

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

07. ජාතික හැඳුනුම්පත් අංකය :————.

08. විවාහක/අවිවාහක බව :————.

09. අධ්‍යාපන සුදුසුකම් :—

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, (විද්‍යා විෂයයන් පමණි.) (ලකුණු සටහන් පිටපත අමුණන්න.)
විභාගයට ඉදිරිපත් වූ දිනය :————.
වර්ෂය :————. විභාග අංකය :————.
Z ලකුණ :————.

| | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |
| 04. | | |

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය :
*පළමු වාරය :————.*
*වර්ෂය :————. විභාග අංකය :————.*

| | *විෂයය* | *ශ්‍රේණිය* | | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|---|---|
| 01. | | | 07. | | |
| 02. | | | 08. | | |
| 03. | | | 09. | | |
| 04. | | | 10. | | |
| 05. | | | 11. | | |
| 06. | | | 12 | | |

*දෙවන වාරය :*
*වර්ෂය :————. විභාග අංකය :————.*

| | *විෂයය* | *ශ්‍රේණිය* | | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|---|---|
| 01. | | | 07. | | |
| 02. | | | 08. | | |
| 03. | | | 09. | | |
| 04. | | | 10. | | |
| 05. | | | 11. | | |
| 06. | | | 12 | | |

10. උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වැරදිකරු වී ඇත් ද? (අදාළ කොටුවේ '✓' යොදන්න.)

| | |
|---|---|
| ඔව් | |
| නැත. | |

"ඔව්" නම් විස්තර සපයන්න. :————.

11. *අයදුම්කරුගේ සහතිකය* :

(*අ*) මම වෙනත් කිසිඳු පූර්ණ කාලීන පාඨමාලාවකට සහභාගි නොවන බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(*ආ*) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි.

| මුද්දර කොටුව |
|---|

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............... මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය 2010 ............... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ

සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

07-981

---

**අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ බඳවාගත් ලේඛන සහකාර හා පාසල් දත්ත සටහන්කරු තනතුරුවලට අයත් නිලධාරීන් සඳහා වන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010**

ඉහත තනතුරුවලට අයත් නිලධාරීන් සඳහා අදාල අනුමත බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධානයන්ට අනුකූලව පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2010 නොවැම්බර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති ගැසට් නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

(iii) මෙම විභාගය සඳහා ඉල්ලුම් කළ හැක්කේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ බඳවා ගනු ලැබූ ලේඛන සහකාර හා පාසල් දත්ත සටහන්කරු තනතුරුධාරීන්ට පමණි.

03. අයදුම්පත්‍ර ඃ

ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. මෙම ආදර්ශ අයදුම්පත අනුව "ඒ 4" ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 04 තෙක් පළමුවන පිටුවටත්, ඉතිරිය දෙවන පිටුවටත් වන ලෙස ගෙන සකස් කළ යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර පිළියෙල කර ගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරෙන් ම සම්පූර්ණ කළ යුතුය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අපේක්ෂකයින් විසින් සිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2010.08.27 දිනට පෙර ලැබෙන සේ "බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්" වෙත ශ්‍රී ලංකා ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත එවීමේ දී ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "විභාගයේ නම" සඳහන් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව නොමැති ඉල්ලුම් පත්‍ර හා භාර ගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එම ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් සඳහන් කරමි. එමෙන්ම ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

04. විභාග ගාස්තු :

සම්පූර්ණ විභාගයටම හෝ එක් විෂයයකට හෝ පෙනී සිටින්නන් විභාග ගාස්තු වශයෙන් රු. 400 ක මුදලක් විභාග කොමසාරිස් ජනරාල් නමින් ආදායම් ශීර්ෂ අංක 2003-02-13 ට බැර වන ලෙස ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපතක් ඉල්ලුම්පත්‍රයේ අදාළ ස්ථානයේ නොගැලවෙනසේ අලවා එවිය යුතුය. තවද, පළමුවන වතාවට පෙනී සිටින විට විභාග ගාස්තු ගෙවිය යුතු නොවන අතර ඊට පසු අවස්ථාවලදී පෙනී සිටින විට ඉහත ආකාරයට විභාග ගාස්තු ගෙවිය යුතුය. එම ලදුපතේ ඡායා පිටපතක් බැගින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

05. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :

අපේක්ෂකයින් විභාගශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුව ද භාර ගනු ලැබේ :—

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කර ලද ජාතික හැඳුනුම්පත;

2. වලංගු විදේශීය ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වේ.

06. අයදුම්පත් පිළිගෙන ඇති නිලධාරින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරින් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපත ද ලියාපදිංචි කළ කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

07. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති -රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවේ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08. තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයිය හැකිය. තමන් ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය පැවැත්වෙන්නේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණි.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

10. විභාග පරිපාටිය :-

(ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත.)

01. කාර්යාල ක්‍රම.- කාලය පැය 01 - ලකුණු 100 යි
බහුවරණ ප්‍රශ්න 50 යි,

02. ගිණුම් ක්‍රම.- කාලය පැය 01 - ලකුණු 100 යි
ව්‍යුහගත ප්‍රශ්න පහකින් හතරකට පිළිතුරු අපේක්ෂිතයි

03. පරිඝණක පරීක්ෂණය - කාලය පැය 01 - ලකුණු 100 යි
බහුවරණ ප්‍රශ්න 50 යි.

11. විෂය නිර්දේශය :-

(01) *කාර්යාල ක්‍රම.*- (පැය 01 යි) ලකුණු 100 යි
රජයේ කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව ද, රාජකාරි ලිපිලේඛන මැනවින් අවබෝධ කොටගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස්/නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝගය අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව ද පරීක්ෂා කෙරේ.

(02) *ගිණුම් ක්‍රම.*- (පැය 01 යි) - ලකුණු 100 යි
රජයේ කාර්යාලවල භාවිත වන මූලික ගිණුම් හා මුදල් පොත්වල කාර්ය පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ.

(03) පරිඝණක හැකියාව විමසන පැය 01 ක බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

තෘතීය අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති ආයතන මගින් මාස 06 කට නොඅඩු කාල සීමාවක දී පරිගණක පාඨමාලා හදාරා ඇති නිලධාරින් මෙම පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

අයදුම්කරුවන්ට පහත සඳහන් හැකියාවන් තිබේදැයි පරීක්ෂා කිරීම මෙම පරීක්ෂණයේ අරමුණ වේ.

තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප,
වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය,
ගොනු කළමනාකරණය

| | |
|---|---|
| වදන් සැකසුම | මූලික කුසලතා, තිරයට හුරුවීම, පාඨ සංස්කරණය පාඨ එකේලි කිරීම, අකුරු වර්ග හා උපලේඛණ, අනුඡේද, ඡේද, පේළි අතර පරතරය වෙනස් කිරීම පිමි අනුයෝගය (Tab Settings), පාඨයක් සෙවීම හා ප්‍රතිෂ්ඨාපනය, අක්ෂර හා ව්‍යාකරණ දෝෂ, සමානාර්ථ පද, තීරු යෙදීම, පිටුව සැකසීම, ලේඛන මුද්‍රණය, වගු නිර්මාණය, අනුපිළිවෙලට සැකසීම, ගොනු කළමනාකරණය, ලේඛනයක් ලිපින කිහිපයකට යැවීමට සැකසීම, මැක්‍රෝ භාවිතය. |
| පතුරුම්පත් | මූලික කුසලතා<br>ආකෘතිකරණය (Formatting)<br>සංස්කරණය<br>තීරු හා පරාස, නව ඇතුළත් කිරීම හා ඉවත් කිරීම<br>දත්ත අනුපිළිවෙලට සැකසීම<br>ප්‍රස්තාර සැකසීම<br>මුද්‍රණය<br>@ ශ්‍රිතය @ (Function)<br>මැක්‍රෝ භාවිතය, ගොනු කළමනාකරණය |
| දත්ත සමුදාය හැඳින්වීම | මූලික කුසලතා<br>දත්ත සමුදාය නිර්මාණය හා භාවිතය<br>ආකෘති<br>සන්ධානගත ආකෘති, උත්පතන ආකෘති (Popup forms) සංවාද හා පණිවුඩ කොටු<br>විමසුම්<br>අනුපිළිවෙලට සැකසීම<br>වාර්තා ලබා ගැනීම<br>මැක්‍රෝ භාවිතය |
| අන්තර්ජාලය | අන්තර්ජාලය හැඳින්වීම, විශ්ව විසිරි ජාලය, මං සොයන ආකාරය, ව්‍යවහාරික අන්තර්ජාලය |
| විද්‍යුත් තැපැල (E- mail) | හැඳින්වීම, මූලික කුසලතා, විදුලි තැපැල ලබාගැනීම, විදුලි තැපැල යැවීම, ඊට ප්‍රතිචාර දැක්වීම, ඇමුණුම් භාවිතය, ලිපිනය හඳුනා ගැනීමට කෙටි නාම භාවිතය, පණිවුඩ සම්පාදනය |

12. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

13. මෙම කඩඉම් විභාගයේ විෂයයන් 03 එක් වතාවකදී හෝ කිහිප වරක දී හෝ පෙනී සිට සමත්වීමට හැකි අතර, සාමාර්ථයක් සඳහා එක් එක් විෂයය සඳහා වූ ලකුණුවලින් අවම වශයෙන් 40% ක් බැගින් නිලධාරීන් විසින් ලබා ගත යුතු වේ.

14. මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

සුනිල් එස්. සිරිසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2010 ජූලි මස 07 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය', බත්තරමුල්ල.

## ආදර්ශ අයදුම්පත්‍රය

*අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ බඳවා ගනු ලැබූ ලේඛන සහකාර හා පාසල් දත්ත සටහන්කරු තනතුරුවලට අයත් නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2009*

First Efficiency Bar Examination for officers belonging to posts of Document Assistants and School Data Entry Operators recruited under the Ministry of Education - 2009

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

සිංහල -2
දෙමළ -3
ඉංග්‍රීසි - 4

01. මුලකුරු අගට යොදා අයදුම්කරුගේ මුලකුරු සමග නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: SUNIL, J. M. U.

1.1 මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 ජාතික හැඳුනුම්පත් අංකය :

02. සේවා ස්ථානය හා ලිපිනය :

2.1 විදුහලේ/විද්‍යා පීඨයේ/ගුරු විදුහලේ/කාර්යාලයේ නම :————.

2.2 රාජකාරි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. දැනට දරන තනතුර :————.
(පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපතක් අමුණන්න.)

3.1 පත්වීම් ලිපියේ අංකය :————.

3.2 පත්වීම් දිනය :————.

04. පෙනී සිටින විෂයය :

| *විෂයය* | *විෂය අංකය* |
|---|---|
| | |
| | |
| | |

05. විභාගයට පෙනී සිටීම සඳහා මුදල් ගෙවූ ලදුපත මෙහි අලවන්න.
අංකය :————. දිනය :————.

ලදුපත ඇලවීම සඳහා (අදාල නම් පමණි).

(ලදුපතේ ඡායා පිටපතක් ලඟතබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම ඇති බවත් ප්‍රකාශ කරන අතර මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කර සිටිමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

*සටහන*.—තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

***අත්සන සහතික කිරීම***

මගේ කාර්යාලයේ/විදුහලේ/විද්‍යා පීඨයේ/ගුරු විදුහලේ නිලධාරියෙකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ................. මහතා/මිය/මෙනවිය ............ දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් මම සහතික කරමි.

————,
අත්සන සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව,
(විදුහල්පති/පීඨාධිපති/ගුරු විදුහල්පති/මාණ්ඩලික නිලධාරී)

:————.



නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපතක් අමුණා ඇති බවත්
3. නිලධාරියා/නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.
(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පීඨාධිපති)

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

07-822

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1, 2-I, 2-II හා 3 වැනි පන්තිවල නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1, 2-I, 2-II හා 3 වැනි පන්තිවල නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2010 නොවැම්බර් මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම විභාගවලට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1086/26 දරන 1999.07.02 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය සහ අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත. (වයස අවුරුදු 45 ඉක්ම වූ නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස්වීමට හැකිවන අයුරින් ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවේ 27 වැනි ඡේදයේ 'ඇ' වගන්තියෙන් සලසා තිබූ විධිවිධානයන් 2001.09.12 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 20/2001 අංක දරන චක්‍රලේඛයෙන් අහෝසි කර ඇති බැවින්, විදුහල්පති සේවයට අයත් සියලුම නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් විය යුතුවේ.)

(අ) *විභාග පරිපාටිය*.- කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයන් පහත දැක්වේ.

විෂය අංක 01, ආයතන සංග්‍රහයේ විධිවිධාන :-
1 වන කොටස - බහුවරණ ප්‍රශ්න 50යි - කාලය පැය 01 යි
ලකුණු 50 යි.
2 වන කොටස - ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයකි - කාලය පැය 01 යි
ලකුණු 50 යි.

විෂය අංක 02 පාසල්වල මූල්‍ය පරිපාලනය
1 වන කොටස - බහුවරණ ප්‍රශ්න 50 යි - කාලය පැය 01 යි.
ලකුණු 50 යි
2 වන කොටස - ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයකි - කාලය පැය 01 යි.
ලකුණු 50 යි.

විෂය අංක 03 අධ්‍යාපන පරිපාලනය හා අධීක්ෂණය
1 වන කොටස - බහුවරන ප්‍රශ්න 50 යි - කාලය පැය 01 යි
ලකුණු 50 යි
2 වන කොටස - ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයකි - කාලය පැය 02 යි
ලකුණු 50 යි.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ඇතුළුව අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල සහ ආයතනවල සංවිධානය සහ කාර්යයන් පාසල් පරිපාලනය, පාසල් හා සමාජය අතර සම්බන්ධතා, පාසල් අධීක්ෂණය සහ ගුරුවරුන්ගේ කාර්ය සාධනය ඇගයීම සහ ජාතික, ප්‍රදේශීය හා පාසල් මට්ටමේ අධ්‍යාපන සැලසුම්කරණය.

03. සාමාර්ථයන් ලැබීම සඳහා අපේක්ෂකයකු ඉල්ලුම් කරන එක් එක් විෂයයකට අවම වශයෙන් 40%ක හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

04. විභාගයේ භාෂා මාධ්‍යය.-සිංහල/දෙමළ/ඉංග්‍රීසි (ඉල්ලුම් කරන මාධ්‍ය වෙනස් කරනු නොලැබේ.)

(i) අපේක්ෂකයකුට රාජ්‍ය භාෂාවෙන් පිළිතුරු ලිවිය හැක ;

*හෝ*

(ii) අපේක්ෂකයා රාජ්‍ය සේවයට ඇතුළුවීම සඳහා පෙනී සිටි තරග විභාගයේ භාෂා මාධ්‍ය හෝ තරග විභාගයක් නොමැතිව රාජ්‍ය සේවයට බැඳුනු අය සම්බන්ධයෙන් ඔවුන් රජයේ සේවයට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යයෙන් පිළිතුරු ලිවිය හැක.

05. යම්කිසි අපේක්ෂකකුට තමන්ට හිමිකමක් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

06. පහත දැක්වෙන ආකෘතියට අනුව, ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රයන් අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, එම ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරන බව වැඩි දුරටත් සඳහන් කරමි. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

07. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර, එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වන නීති රීති මෙම නිවේදනය අවසානයේ පළකොට ඇත.

08. ඉල්ලුම්පත් 2010 අගෝස්තු මස 30 වැනි දින හෝ ඊට ප්‍රථම බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි විදුහල්පති/කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්‍ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ මගින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. මෙදිනට පසු ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද ලියාපදිංචි කළ කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රයට එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(i) විභාගයේ නම :————.
(ii) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
(iii) අපේක්ෂකයාගේ සම්පූර්ණ ලිපිනය :————.
(iv) ඉල්ලුම්පත්‍රය තැපැල් කළ දිනය, ලියාපදිංචි කළ අංකය හා තැපැල් කන්තෝරුව :————.
(v) නුදුරුව සිටින අයට පණිවුඩකරුවකු මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දෙන ලෙස උපදෙස් දෙනු ලැබේ. :————.

10. ඉහත 08 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ (පසුව ඉදිරිපත් කරනු ලබන) පැමිණිලි සළකා බලනු නොලැබේ.

11. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වේ. ඒ සඳහා;

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය පමනක් පිළිගනු ලැබේ.

12. විභාග ගාස්තු ඃ

(අ) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

(ආ) සම්පූර්ණ විභාගය හෝ ඉන් කොටසක් සඳහා හෝ පළමුවැනි වතාවේ දී ගාස්තු අය කරනු නොලැබේ.

(ඇ) ඊට පසු එක් එක් වතාව සඳහා අය කෙරෙන ගාස්තු පහත දැක්වේ.

සම්පූර්ණ විභාගය සඳහා රු. 200
එක් විෂයයක් සඳහා රු. 75

මුළු විභාගය සඳහා විභාග ගාස්තුව රුපියල් 200 ක්ද එක් විෂයයක් සඳහා රුපියල් 75ක් වන බවත් විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂයට 2003.02.13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

13. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කලහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇතිබව දන්වමි.

සුනිල් එස්. සිරිසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2010 ජූලි මස 30 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

***ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව***

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1/2-I/2-II/3 පන්තිවල නිළධාරින් සඳහා වන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය - 2010
Efficiency Bar Examination for Officers in class 1/2-I/2-II/3 in Sri Lanka Principals Service - 2010

(විදුහල්පති/කොට්ඨාස/කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ මගින් බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න. විභාගයේ නම කවරයේ වමත් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.)

| | |
|---|---|
| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අංකය කොටුව තුළ ලියන්න.) | |

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

01. (අ) මුලකුරු අගට යොදා මුලකුර සමඟ නම :————.
(මුල් අකුරු සමග ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(උදා. ඃ SILVA. H. A.)

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමලෙන්) :————.

02. උපන් දිනය වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

03. (i) විදුහල්පති සේවයේ පන්තිය/ශ්‍රේණිය :————.
(ii) පාසල/කාර්යාලය :————.
(iii) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව/කලාප අධ්‍යාපන කාර්යාලය :————.

04. ලිපිනය
(i) පෞද්ගලික :————.
(ii) රාජකාරි :————.
(iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

05. ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | |

06. ගැසට් නිවේදනයේ 02 වැනි ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය සහිතව අයැදුම් කරනු ලබන විෂයන්

විෂය අංකය 01 - ආයතන සංග්‍රහයේ විධිවිධාන
විෂය අංකය 02 - පාසල්වල මූල්‍ය පරිපාලනය
විෂය අංකය 03 - අධ්‍යාපන පරිපාලනය හා අධීක්ෂණය

අදාළ විෂය අංකය/අංක කොටුව/කොටු තුළ ලියන්න.

07. මීට ප්‍රථම මෙම විභාගයට සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් හෝ පෙනී සිට තිබේදැයි සඳහන් කරන්න. එසේ නම් විෂය ද විෂය අංකය ද වසර සහ මාධ්‍යය ද සඳහන් කරන්න.

| විෂය | විෂය අංකය | වසර | මාධ්‍යය |
|---|---|---|---|
| | | | |

08. විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ විස්තර
ලදුපත් අංකය :—————.
ප්‍රාදේශීය/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය :—————.
දිනය :—————.

ලදුපත මෙහි අලවන්න.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා එකඟ වෙමි.

—————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :—————.

විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයා මගේ පාසලේ/කාර්යාලයේ නිලධාරියකු බව මම සහතික කරමි. තවද, අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

—————,
විදුහල්පති/කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන
අධ්‍යක්ෂ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අත්සන.
(විදුහල්පතිවරයකු නම් පාසලේ නම සඳහන් කරන්න.)

ලිපිනය :—————.
දිනය :—————.
(අදාළ නොවන වචන කපා හරින්න.)

07-916

---

## සංශෝධනය කිරීමයි

### අධ්‍යාපන අමාත්‍යාංශය

ගුරු අධ්‍යාපනය පිළිබඳ පූර්ව සේවා වෘත්තීය පාඨමාලාවක් හැදෑරීම සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කර ගැනීම - 2011

2010 ජූලි මස 09 වැනි සිකුරාදා දින අංක 1662 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I කොටසේ (IIඅ) ඡේදයෙහි විභාග, විභාග ප්‍රතිඵල ආදිය යන කොටසෙහි ඉහත මාතෘකාව යටතේ පළ වූ දැන්වීමෙහි අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2010.07.30 වෙනුවට 2010.08.06 ලෙස සංශෝධනය විය යුතුය.

සුනිල් එස්. සිරිසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2010 ජූලි මස 21 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

07-1028

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.